# සාමාන්‍ය සමයේ දසතුන්වන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 27: 1-5, 15-29

"ජාකොබ් ඒසව්ගේ තැනගෙන ඔහුගේ ආශිර්වාදය සොරා ගතියි."

ඊසාක් මහලු වයසට පැමිණ ඔහුගේ ඇස් ද නොපෙනෙන තරමට අඳුරු වී තිබිණි. ඔහු තම දෙටු පුත් ඒසව් කැඳවා "පුතා" කියා ඇමතීය. ඔහු ද "ඇයි තාත්තේ" කියා උත්තර දුනි. එවිට ඔහු කතා කොට "බලන්න දැන් මම මහලු ය. කවදා මා මැරේදැයි නොදනිමි. එබැවින් කරුණාකර නුඹ දැන් නුඹේ දඩයම් උපකරණ වන හී කොපුව සහ දුන්න රැගෙන වනයට ගොස් මට මුව මස් රැගෙන මා ප්‍රිය කරන ප්‍රණීත ආහාරයක් පිළියෙල කර එය ගෙනැවිත් මට කන්න දෙන්න. එවිට මම මැරෙන්නට පෙර නුඹට ආශිර්වාද කරන්නෙමි"යි කීය.

ඊසාක් සිය පුත් ඒසව්ට මෙය කියනු රෙබෙකා අසා ගෙන සිටියාය. ඒසව් ද දඩයම් කර මුව මස් ගෙනෙනු පිණිස වනයට පිටත් විය.

පසුව රෙබෙකා ගෙදර තිබුණු දෙටු පුත් ඒසව්ගේ අගනා වස්ත්‍ර රැගෙන, තම බාල පුත් ජාකොබ්ට හඳවා ඔහුගේ අත් දෙක හා බෙල්ලේ සිනිඳු හරිය එළු හම් වලින් වසා, ඈ පිසූ ප්‍රනීත ආහාරය ද රොටී ද ඔහු අත තැබුවා ය.

ඔහු ද පියා වෙත පැමිණ, "තාත්තේ" කියා ඇමතීය. පියා ද, "ඇයි පුතා, උඹ කවරෙක් දැ"යි ඇසීය. එවිට ජාකොබ් උත්තර දෙමින් "මම ඔබේ කුලුඳුල් පුත් ඒසව් ය. ඔබ කී පරිදි මම ඉටු කළෙමි. කරුණාකර, නැගිට, වාඩිවී මාගේ මුව මස් අනුභව කරන්න. එවිට මට ආශිර්වාද කරන්න නුඹට පුළුවනැ"යි කීය. ඊසාක් තම පුතුට කතා කරමින්, "පුතා, උඹ මේවා මෙතරම් ඉක්මණින් සොයාගත්තේ කෙසේදැ"යි ඇසීය. "ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ මේවා මට ඉක්මණින් ලැබෙන්නට සැලසූ සේකැ"යි ඔහු උත්තර දුනි.

එවිට ඊසාක් ජාකොබ් අමතමින්, "පුතා, නුඹ මේ මාගේ පුත්‍ර ඒසව් ද නැද්ද යි අතගා බලන්න, කරුණාකර මට කිට්ටුවෙන්නැ"යි කීය. ජාකොබ් ද පියා සමීපයට කිට්ටු වූ විට පියා ඔහු අතගා බලමින් "කටහඬ නම් ජාකොබ්ගේ වගෙයි. අත් දෙක නම් ඒසව්ගේ හැඩය"යි කීය. සිය සොහොයුරුගේ අත් දෙක මෙන් ඔහුගේ අත් ලොම් වලින් වැසී තිබුණ බැවින් ඔහු තම පුතා හැඳින නොගත්තේය. එබැවින් ඔහු ආශිර්වාද කරන්නට අරඹමින්, "නුඹ මාගේ පුත් ඒසව්ම දැ"යි ඇසීය. "එසේ ය"යි ඔහු ද උත්තර දුනි. "එසේ නම් නුඹ පිළියෙල කළ මුව මස් අනුභව කොට මා නුඹට ආශිර්වාද කරනු පිණිස එය මා ළඟට ගෙනෙන්නැ"යි ඊසාක් කීය. ඔහු එය පියා ළඟට ගෙනා විට පියා එය අනුභව කළේය. තවද ජාකොබ් මිදි යුස ද ගෙනා විට, පියා එය ද පානය කළේය. ඉන්පසු ඔහුගේ පියා වන ඊසාක් ඔහු අමතමින්, "පුතා දැන් මා ළඟට කිට්ටු වී මා සිඹින්නැ"යි ඉල්ලීය. ඔහු ද ළඟට කිට්ටු වී පියා සිඹ ගත්තේය. එවිට පියාට තම පුත්‍රයාගේ වස්ත්‍රවල සුවඳ දැනී, ඔහුට මෙසේ ආශිර්වාද කළේය.

> "බලන්න, මා පුතු සුවඳ, සමිඳුන් ආසිරින් කෙතක සුවඳ මෙනි.
> කෙතක සුවඳ මෙනි.

අහසින් පිනි ද පොළොවෙන් පල ද බොහෝ ධාන්‍ය ද මිදියුස ද
දෙවිඳාණෝ නුඹ හට දෙන සේක්වා!
ජනයෝ නුඹට මෙහෙ කරත්වා!
ජාතීහු නුඹට හිස නමත්වා!
සොහොයුරන්ගේ අධිපති නුඹ වේවා!
නුඹේ මවගේ පුත්තු නුඹට හිස නමත්වා!
නුඹට සාප කරන්නාට සාප වේවා!
නුඹට ආසිරි දෙන්නාට ආසිරි ලැබේවා!

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය **135 : 1 – 6**

පිළිතුර: සමිඳාණෝ යහපත් බැවින් උන් වහන්සේට ප්‍රශංසා කරමු.

ගීය:

සමිඳුන්ට ප්‍රශංසා කරන්න. සමිඳුන්ගේ මෙහෙකරුවෙනි, සමිඳුන්ගේ නාමයට ප්‍රශංසා කරන්න. සමිඳුන්ගේ මාළිගාවෙහි, අපේ දෙවිඳුන්ගේ මාළිගාවෙහි මණ්ඩපවල සිටින්නෙනි, එතුමන්ට ප්‍රශංසා කරන්න. සමිඳුන්ට ප්‍රශංසා කරන්න. එතුමාණෝ යහපත් ය.

එතුමාණෝ කරුණාබර වන සේක. එතුමන්ගේ නාමයට ගී ගයන්න. සමිඳාණෝ තමන්ට ම ජාකොබ්ගේ පෙළපත ද තමන්ගේ විශේෂ උරුමය කොට ඉශ්රායෙල් සෙනඟ ද තෝරාගත් සේක.

සමිඳාණන් අති උතුම් බවත් වෙනත් සියලු දෙවිවරුන්ට වඩා අපේ සමිඳාණන් උසස් බවත් දනිමි.
සමිඳාණෝ, යමක් කරන්නට කැමැති සේක් නම්, අහසෙහි ද, පොළොවෙහි ද මුහුදුවල සහ හැම ගැඹුරු තැන්වල ද එය ඉටු කරන සේක.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, දයාවෙන් මා දෙස බැලුව මැනව.
ඔබේ පණත් මට ඉගැන්නුව මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති. මම ද ඔවුන් අඳුනමි.
ඔව්හු ද මා පස්සේ එති" යි ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 9: 14–17

"මනාලයා තමන් සමඟ සිටිය දී ඔව්හු ශෝක නොවන්නෝ ය."

ජුවාම්ගේ ගෝලයෝ ජේසුස් වහන්සේ වෙත අවුත්, "පරිසිවරුත් අපිත් නිතරම උපවාස කරමු. එහෙත් ඔබේ ගෝලයන් උපවාස නොකරන්නේ මන්දැ"යි ඇසූහ. ජේසුස් වහන්සේ ඔවුන්ට කතා කොට මෙසේ වදාළ සේක. "මනාලයා තමන් සමඟ සිටිය දී ඔහුගේ ඥාති මිත්‍රාදීන්ට ශෝක විය හැකිද? නොහැකිය. එහෙත්, මනාලයා ඔවුන් කෙරෙන් වෙන් කරනු ලබන දවසක් පැමිණේ. ඔවුන් ඒ දවසේ දී උපවාස කරනු ඇත.

"නාන් රෙදි කඩකින් පරණ වස්ත්‍රයකට අණ්ඩයක් දමන කිසිවෙකු නැත. මන්ද, එසේ කළොත්, අණ්ඩයට ගත් රෙදි කඩින් වස්ත්‍රය ඇදී ඉරුම වඩා ලොකු වේ. නව මිදියුස පරණ බඳුන්වල වත් කරන කිසිවෙක් නැත. වත් කළොත්, බඳුන පැළී, මිදියුස ඉතිරී, බඳුනුත් නාස්ති වන්නේය. එසේ නොව, ඔව්හු නව මිදියුස නව බඳුන් වල වත් කරති. එවිට ඒ දෙකම ආරක්ෂා වේ.

සුවිශේෂ වාක්‍යය එසේය.